# හරිත ගොඩනැගිලි ඉදිකිරීමේ ක්‍රමය







1 ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි ද්‍රව්‍ය භාවිතය

2 තිරසාර බලශක්ති ක්‍රම උපයෝගීකර ගැනීම (සූර්යය පැනල, සුලං පෙති ) හා ආලෝකකරණය සඳහා හිරු එළිය උපරිමයෙන් භාවිතා කිරීම

3 වැසි ජලය රැස්කිරීම හා ජලය පිරිමැසීම වැඩිකරන ජල උපාංග භාවිතය

4 පරිසර හිතකාමී භූමි නිර්මාණය

5 අප ද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම





## හරිත ගොඩනැගිලි ඉදිකිරීම්

බල ශක්තිය 50%-85%

$CO_2$ පිටවීම 40%

ජලය භාවිතය 40%-60%

අප ද්‍රව්‍යය නිපදවීම 70%

හරිත ගොඩනැගිලි හා ඉදිකිරීම් මගින් මේවා අඩු කෙරේ.

## CECB විසින් ඉදිකරන ලද හරිත ගොඩනැගිලි

ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුව



## ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති

මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශ ගොඩනැගිල්ල



සෞඛ්‍යය අමාත්‍යාංශ ගොඩනැගිල්ල





සැකසුම
පර්යේෂණ හා සංවර්ධන කේන්ද්‍රය
ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
නො 415 , බෞද්ධාලෝක මාවත ,කොළඹ 07.

SRI LANKA NEXT

"නීල හරිත යුගයක්" සමුළුව හා ප්‍රදර්ශනය 2016

# හරිත ගොඩනැගිලි තාක්ෂණය




ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## හරිත ගොඩනැගිලි යනු කුමක් ද ?



හරිත ගොඩනැගිලි නම් ,මූලික ඉදිකිරීම් ප්‍රමිතීන්ට අනුව සාදන ලද ගොඩනැගිලි හා සසදන විට, අතිශයින් වැදගත් සම්පත් වන අමුද්‍රව්‍යය, බලශක්තිය, ජලය සහ භූමිය වඩාත් ඵලදායී ලෙස භාවිතා කරමින් සාදන ලද ගොඩනැගිලි වේ.

හරිත ගොඩනැගිලි පරිසරයට වඩාත් උචිත වන අතර සෞඛ්‍යය සම්පන්න, සුවපහසු, ඵලදායී ගෘහස්ථ අවකාශයක් සකසයි.

## හරිත ගොඩනැගිලි ඉදිකිරීමේ වාසි

<u>පාරිසරික වාසි</u>

- පිරිසිදු වාතාශ්‍රය
- ජලය ඉතිරි වීම
- උෂ්ණත්වය පාලනය
- අප ද්‍රව්‍ය උත්පාදනය අඩුවීම

<u>ආර්ථිකමය වාසි</u>

- බලශක්තිය සහ ජලය ඉතුරුම් ක්‍රමයක් වීම
- දේපළ වටිනාකම වැඩි වීම
- ජලය සහ බලශක්තිය සඳහා වන ඉල්ලුම අඩු වීම
- සේවක පැමිණීම වැඩි දියුණු වීම
- සේවක ඵලදායීතාවය වැඩි දියුණු වීම
- අලෙවිය ඉහළ යාම
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කුසලතාවයන් වර්ධනය වීම

<u>සාමාජීය වාසි</u>

- සෞඛ්‍යය තත්වයන් වැඩි දියුණු වීම
- සෞඛ්‍යය සම්පන්න ජීවන රටාවක් ඇති වීම

## හරිත ගොඩනැගිලිවල විශේෂාංග

## පරිසර හිතකාමී ඉදිකිරීම්

- **ජල කාර්යක්ෂමතාවය**

භූමි අලංකරණය සඳහා කරන වගාවන් සඳහා වැසි ජලය ජල ටැංකි තුලට එක් රැස්කර පරිහරණය කිරීම. ජල පරිවහනය අඩු, ජලය රහිත හෝ කොම්පෝස්ට් පොහොර නිපදවිය හැකි ක්‍රමවේදයන් සහිත වැසිකිළි භාවිතය තුලින් ජල පරිහරණය අවම කිරීමට හැකිය.

- **විකල්ප බලශක්ති**

වහළය මුදුනේ සවිකරන ලද සුළං ටර්බයින සහ සූර්ය පැනල මගින් බාහිර බලශක්ති ප්‍රභවයන් හි අවශ්‍යතාව අවම වේ.

- **හරිත වහල**

වහලවල් මත තුනී ශාක හා පස් තට්ටුවක් යෙදීම තුලින් ආරක්ෂකයක් ලබා දීම, පොළොව මතුපිට ජලය ගලා යෑම අවම කිරීම, කාබන් ඩයොක්සයිඩ් අවශෝෂණය හා ඔක්සිජන් නිපදවීම සිදු වේ.




- **ජනේල**

ජනේල සහ සූර්යාලෝක කවුළු මගින් ස්වාභාවික ආලෝකය, උණුසුම හෝ සිසිලස ලබාදෙයි. වීදුරු හෝ පළු දෙකේ ජනේල තුලින් තාපය පරිවරණය කෙරේ.

- **වාතාශ්‍රය**

කවුළු සහ විවෘත කළ හැකි ජනේල මගින් වායු සංසරණය වන අතර එමගින් නිවස තුල උණුසුම හා සිසිලස ලබා දීමට උපකාර වේ.

- **ගොඩනැගිලි ද්‍රව්‍ය**

ප්‍රතිචක්‍රීයකරණය කළ ද්‍රව්‍ය භාවිතයෙන් අපද්‍රව්‍ය අවම වේ. පරිසර හිතකාමී දැව භාවිතයෙන් වනාන්තර ආරක්ෂා වන අතර, විෂ රහිත තීන්ත හා බිම් ඇතිරිලි යෙදීමෙන් වඩා සෞඛ්‍ය සම්පන්න අභ්‍යන්තර අවකාශයක් සෑදේ.